ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරිනියක පැහැර ගැනුණේ යැයි පැවසෙන ප්‍රවෘත්තිය, පසුගිය දින කිහිපය පුරාම පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ විශාල කතාබහකට ලක් වුණි. ඇය ප්‍රකාශයක් ලබා දීම උදෙසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි අතර, එයද මාධ්‍ය ඔස්සේ පුළුල්ව ආවරණය වී තිබිණි. මෙහිදී ඇතැම් පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය මඟින් ඇගේ අනන්‍යතාවය හෙළි නොවන අයුරින් මෙම පුවත වාර්තා කර තිබුණත්, තවත් පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය හඳුනාගත හැකි ආකාරයකින් ඇගේ සේයාරුව සහ වීඩියෝ පළ කර තිබීමත්, මේ අතරින් ඇතැම් මාධ්‍ය ඇගේ රූපය විශේෂයෙන් රවුම් කරමින් හුවා දක්වා තිබීමත් නිරීක්ෂණය කළ හැකි විණි. මෙහිදී අප සිහිපත් කළ යුත්තේ ඇයට ලිංගික අතවරයකට ද මුහුණ දීමට සිදුවූවායැයි වාර්තා වන බවයි. එසේම මේ සම්බන්ධයෙන් වන පරීක්ෂණ කටයුතු තවමත් නිමා වී නොමැති බවයි. එවන් පසුතලයකදී ඇයගේ අනන්‍යතාවය මෙසේ හෙළිදරව් කිරීම කෙතරම් සදාචාරාත්මකද? මෙය මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කිරීමක් නොවේද?

#MediaEthicsSL #lka #TVchannels #lka #Rupavahini #ITN #Swarnavahini #SirasaTV #HiruTV #TVDerana #SiyathaTV #SinhalaPress #Lankaadeepa #Divaina #Dinamina #Aruna #Mawbima #Resa #Ada #TamilPress #Virakesari #Thinakaran #Thinakkural #EnglishPress #DailyMirror #TheIsland #DailyNews #CeylonToday